# INTERNATIONAL COMMISSION OF JURISTS

Commission internationale de juristes - Comisión Internacional de Juristas

*" dedicated since 1952 to the primacy, coherence and implementation of international law and principles that advance human rights "*

**ප්‍රවෘත්ති නිවේදනය**


President
Justice Arthur CHASKALSON, South Africa

Vice-Presidents
Dato' Param CUMARASWAMY, Malaysia
Lord William GOODHART, United Kingdom

Executive Committee
Justice Ian BINNIE, Canada
Dr. Rajeev DHAVAN, India
Prof. Louise DOSWALD-BECK, Switzerland
Justice John DOWD, Australia (Chairperson)
Prof. Jochen A. FROWEIN, Germany
Dr. Gustavo GALLÓN GIRALDO, Colombia
Mr Stellan GÄRDE, Sweden
Sir Nigel RODLEY, United Kingdom
Prof. Daniel THÜRER, Switzerland

Other Commission Members
Prof. Abdullahi AN-NA'IM, Sudan
Justice Solomy BALUNGI BOSSA, Uganda
Ambassador Julio BARBOZA, Argentina
Prof. Alexander BRÖSTL, Slovakia
Prof. Juan Antonio CARRILLO SALCEDO, Spain
Ms Christine CHANET, France
Lord COOKE OF THORNDON, New Zealand
Prof. Vojin DIMITRIJEVIC, Serbia and Montenegro
Justice Unity DOW, Botswana
Ms Vera DUARTE, Cape-Verde
Prof. Paula ESCARAMEIA, Portugal
Justice Elisabeth EVATT, Australia
Prof. Ruth GAVISON, Israel
Prof. Jenny E. GOLDSCHMIDT, Netherlands
Ms Asma JAHANGIR, Pakistan
Prof. David KRETZMER, Israel
Prof. Kazimierz Maria LANKOSZ, Poland
Ms Gladys Veronica LI, Hong Kong
Prof. Cecilia MEDINA QUIROGA, Chile
Mr Kathurima M'INOTI, Kenya
Ms Karinna MOSKALENKO, Russia
Dr. Adnan B. NASUTION, Indonesia
Dr. Pedro NIKKEN, Venezuela
Prof. Manfred NOWAK, Austria
Prof. Andrei RICHTER, Russia
Justice Michèle RIVET, Canada
Dr. Mary ROBINSON, Ireland
Justice A.K.M. SADEQUE, Bangladesh
Mr Claes SANDGREN, Sweden
Mr Jerome SHESTACK, U.S.A.
Dr. Hipolito SOLARI YRIGOYEN, Argentina
Mr Raji SOURANI, Palestine
Prof. U. Oji UMOZURIKE, Nigeria
Prof. Vilenas VADAPALAS, Lithuania
Prof. Theo VAN BOVEN, Netherlands
Prof. Yozo YOKOTA, Japan
Dr. José ZALAQUETT, Chile
Prof. Leila ZERROUGUI, Algeria


## ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම (ICJ), ACF ආධාර සේවකයන් 17 දෙනාගේ මරණ පිළිබඳ මරණ පරීක්ෂණ නිරීක්ෂණය කිරීම අරඹයි.

2006 අගෝස්තු මාසයේ මුතූර්හිදී සිදුකෙරුණු ACF මානුෂික ආධාර සේවකයන් 17 දෙනාගේ ඝාතනයන්ට අදාළ මරණ පරීක්ෂණ නිරීක්ෂණය කිරීම හෙට (නොවැම්බර් 22 දා) ආරම්භ කරන බව ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම ( ICJ) නිවේදනය කරයි.

ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසමේ නිරීක්ෂක රැජිණ නීතිඥ මයිකල් බර්න්බවුම් මහතා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව පරීක්ෂණ සිදුවන්නේදැයි නිරීක්ෂණය කරනු ඇත.

මෙම ශ්‍රී ලාංකික ආධාර සේවකයන් 17 දෙනාගේ මරණවලට හේතුව සොයාගැනීමේ, ඔවුන්ගේ මරණවලට වගකියුත්තේ කවුරුන්දැයි හඳුනාගැනීමේ, හා එම වගකිවයුත්තන්ට එරෙහිව නඩු කටයුතු ආරම්භ කිරීමේ ක්‍රියාවලියේ පළමු පියවර මෙම මරණ පරීක්ෂණ විය යුතුයැ'යි ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම ප්‍රකාශ කරයි.

ජීවිතවලට හා පැවැත්මට එරෙහි තර්ජනවලින් සාක්ෂිකරුවන් ප්‍රමාණවත් ලෙස ආරක්ෂා වන බවට සහතික වීම සඳහා ප්‍රායෝගික පියවර ගන්නා ලෙස ශ්‍රී ලංකා රජයට කර ඇති ආයාචනය ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසම නැවත අවධාරණය කරයි. මේ අවස්ථාවේදී ඉදිරියට ඒම සඳහාත් ඔවුන් සතුව තිබිය හැකි, සිදුවීමට අදාළ කුමනාකාරයක හෝ සාක්ෂි ඉදිරිපත් කිරීම සඳහාත් සාක්ෂිකරුවන්ට ප්‍රමාණවත් ආරක්ෂාව අවශ්‍ය වෙයි.

**පසුබිම**

රැජිණ නීතිඥ මයිකල් බර්න්බවුම් මහතා අපරාධ නීතිය සම්බන්ධ පැමිණිල්ලේ හා විත්තියේ බැරිස්ටර්වරයකු ලෙස දේශීය හා ජාත්‍යන්තර ක්ෂෙත්‍රයන්හි වසර 35 කට වැඩි වෘත්තීය පළපුරුද්දක් ඇත්තෙකි. එසේම රෙකෝඩර්වරයෙකු (නියෝජ්‍ය විනිසුරුවරයකු) ලෙස පසුගිය වසර 15 කට ආසන්න කාලයක සිට මේ දක්වාම කටයුතු කරයි. මයිකල් බර්න්බවුම් මහතා නයිජීරියාවේ හා සියෙරා ලියොන්හි නඩුවිභාග නිරීක්ෂණය කර ඇති අතර අමෙරිකාව, ඉන්දියාව, හොංකොං, මැලේසියාව, සියෙරා ලියොන් හා නයිජීරියාව යන රටවල මානව හිමිකම් ආශ්‍රිත නඩු පිළිබඳ මත ඇතුළත් ලේඛන ගණනාවක් ලියා ඇත. ඔහු කැරිබියානු අධිකරණවල සිට රාජාධිකරණයේ අධිකරණ කමිටුව වෙත ඉදිරිපත්වන අභියාචනයන්හි දී නිරතුරුව වගඋත්තරකරුවන් නියෝජනය කරයි.


P.O. Box, 91, Rue des Bains, 33, 1211 Geneva 8, Switzerland
Tel: +41(0) 22 979 3800 – Fax: +41(0) 22 979 3801 – Website: http://www.icj.org - E-mail: info@icj.org